රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2025.05.06

සියලුම මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 මැයි 06**

**මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය ලබා දීම**

උක්ත මාතෘකාවට අදාළව මැතිවරණ කොමසාරිස් ජනරාල්, සමන් ශ්‍රී රත්නායක මහතා විසින් නිකුත් කරන ලද නිල නිවේදනය අවශ්‍ය කටයුතු සඳහා මේ සමග ඔබ වෙත යොමු කරමි.

එම නිල නිවේදනයේ ඇතුළත් මාර්ගෝපදේශ හා උපදෙස් කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටින අතර, මැතිවරණ ප්‍රතිඵල විකාශනයේදී මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් හා මගපෙන්වීම්වලට පටහැණිව ක්‍රියාකරන මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි.

මේ සඳහා ඔබ මාධ්‍ය ආයතනය දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**එච්.එස්.කේ.ජේ. බණ්ඩාර**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

දුරකථන අංකය: 0112513638
ෆැක්ස්: 0112514753
විද්‍යුත් තැපැල් ලිපිනය: dg@dgi.gov.lk

පිටපත්:

01. සභාපති, මැතිවරණ කොමිෂන් සභාව - කාරු.දැ.ගැ. සඳහා
02. මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමිෂන් සභාව - කාරු.දැ.ගැ. සඳහා

# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல் ஆணைக்குழு

06 MAY 2025

පොදු කාර්යාලය 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස් /தொலைநகல்: 011-2868426
*website : www.elections.gov.lk*

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත, රාජගිරිය. (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)
*e-mail : info@elections.gov.lk*

මගේ අංකය : EC/ITB/LAE/2025/RD | ඔබේ අංකය : | දිනය : 2025.05.06
எனது இல. : | உமது இல : | திகதி:

සියළුම මාධ්‍ය ආයතන වෙත,

<u>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 මැයි 06</u>
<u>මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය ලබා දීම</u>

**01. නිල මැතිවරණ ප්‍රතිඵල නිකුත් කිරීම**

2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී සහතික කරන ලද නිල මැතිවරණ ප්‍රතිඵල් විකාශනය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය ලබා ගත යුතු වේ. අදාළ ගෙවීම් සිදුකර ලියාපදිංචි වන විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහා පමණක් සහතික කරනු ලබන ප්‍රතිඵල, ආරක්ෂිත පරිගණක ජාලයක් මඟින් එසැනින් ලබා දීමට අවශ්‍ය කටයුතු මැතිවරණ කොමිෂන් සභාව විසින් සම්පාදනය කර ඇත

**02. නිල නොලත් මැතිවරණ ප්‍රතිඵල ( Un Official Election Results) විකාශනය**

සියළුම විද්‍යුත් මාධ්‍ය (රූපවාහිනී, චන්ද්‍රිකා රූපවාහිනී, ගුවන් විදුලි, අන්තර්ජාල පුවත්පත්, වෙබ් අඩවි, මුහුණුපොත (Facebook), YouTube, ජංගම දුරකථන මෘදුකාංග, ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා සහ වෙනත් සමාජ මාධ්‍ය ජාල) විසින් නිල නොවන ප්‍රතිඵල විකාශනය කිරීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම නොකළ යුතුය.

**03. ප්‍රතිඵල විකාශන අයිතිය සඳහා ලියාපදිංචි නොවූ විද්‍යුත් මාධ්‍ය**

මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ විධිමත් ලෙස ලියාපදිංචි නොවන සියළුම විද්‍යුත් මාධ්‍ය ආයතන විසින් ප්‍රතිඵල එසැනින් ප්‍රචාරය කිරීමෙන් වැලකී සිටිය යුතු වේ.

**සැලකිය යුතුයි**

**3.1** මෙම නිවේදනයේ සඳහන් පරිදි, විකාශන අයිතිය සඳහා ලියාපදිංචි වන විද්‍යුත් මාධ්‍ය ආයතනවලට වුවද ප්‍රතිඵල පරිගණක ජාල මඟින් ලබා දීමේ අවසන් තීරණය මැතිවරණ කොමිෂන් සභාව සතු වේ. සම්බන්ධතාවය ඔස්සේ අමතර තොරතුරු ලබා ගැනීමට කරන අයැදුමක් හෝ උත්සාහයක් දැඩිව තහනම් බව කරුණාවෙන් සලකන්න.

**04. සියළුම මුද්‍රිත මාධ්‍ය ආයතන (පුවත්පත්)**

මුද්‍රිත පුවත්පත් සඳහා ප්‍රතිඵල ලබා දීමට ගාස්තුවක් අය නොකරන අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ඇත. ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා සහතික කරන ලද ප්‍රතිඵල ලේඛනවල පරිලෝකනය කළ පිටපත් (Scanned Copy) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් අවශ්‍ය කටයුතු සිදු කර ඇත. එසේ වුවද පුවත්පත්වල තුල සිදුකරන ප්‍රතිඵල විකාශන සඳහා නිසි අවසරයක් ලබා ගතයුතු අතර ඒලෙස ලබා නොමැති නම් එම පුවත්පත් හා එම අවසරය ලබා ගැනීමට ක්‍රියාකළ යුතු වේ.

**05. විදේශීය මාධ්‍ය ආයතන**

විදේශ මාධ්‍ය ආයතන වල ශ්‍රී ලාංකික නියෝජිතයින් සඳහා සහතික කළ ප්‍රතිඵල රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හරහා ලබා ගැනීමට අවසර ඇත.

**06. VPN සම්බන්ධතාවය**

SLT සපයන VPN සම්බන්ධතාවය එක් පරිශීලක උපාංගයකට පමණක් සහය දක්වන ලෙස සැකසීම කර ඇත. ඔබගේ ප්‍රධාන උපාංගය හදිසි බිඳ වැටීමකට ලක්වූ අවස්ථාවක, පූර්ව-සැකසූ මූලික නොවන (backup) උපාංගයක් VPN සම්බන්ධතාවයට භාවිතා කිරීමට ඔබට අවසර ඇත.

එක් වේලාවකදී එක් VPN සම්බන්ධතාවයකට එක් උපාංගයක් පමණක් සක්‍රීයව සම්බන්ධ වී ඇති බවට වගබලා ගැනීම අත්‍යවශ්‍යය. මැතිවරණ ප්‍රතිඵල ඔබට ස්වයංක්‍රීයව පහත සඳහන් ගොනු ආකෘතිවලින් ලැබීමට සලස්වනු ඇත.( JSON, PDF, XML, සහ HTML.)

VPN ජාලය මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් නිරන්තරව අධීක්ෂණය කරනු ලැබේ. VPN භාවිතයේ කිසිදු සැක සහගත හෝ අසාමාන්‍ය හැසිරීමක් අනාවරණය වුවහොත්, පූර්වදැනුම්දීමක් නොමැතිව VPN සම්බන්ධතාවය ක්ෂණිකව අත්හිටුවනු ලැබේ. ඒ සම්බන්ධයෙන් වන අවසන් තීරණය මැතිවරණ කොමිෂන් සභාව විසින් පමණක් ගනු ඇත.

**07. වෙනත් කරුණු**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් මැතිවරණ ප්‍රතිඵල මාධ්‍ය වෙත ලබා දීමේ කාර්යය මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන්ගේ පාලනය යටතේ සිදු කෙරෙන අතර මේ සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT), කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යායතනයේ (UCSC) සහ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM) යන ආයතන වල සේවයේ නියුතු තොරතුරු තාක්ෂණවේදී විශේෂඥයින්ගේ උපදෙස් සහ සහය මේ සඳහා ලබාගෙන ඇත.

**08.** 2025.05.06 දින ප. ව 6.00 සිට අවසන් ඡන්ද ප්‍රතිඵලය නිකුත් කර එක් පැයක කාල සීමාව තුල සංස්කරණය නොකරන ලද හඬපටය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත 2025.05.15 දින හෝ ඊට පෙර භාර දිය යුතුය.

**09.** සෑම නිල ප්‍රතිඵලයක්ම නිසි ලෙස නිවැරදිව කඩිනමින් මහජනතාව වෙත ලබා දීම සඳහා ඉහත සඳහන් කරනු වලට අනුකූලව සියළුම මාධ්‍ය ආයතන ක්‍රියාකළ යුතු බව කාරුණිකව දන්වමි


**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්


**පිටපත් : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ,රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**
මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් හා මඟ පෙන්වීම්වලට පටහැනිව ක්‍රියාකරන මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඉහත 08 ඡේදයේ සඳහන් කාර්යය ඉටු කිරීම සඳහා